# ශ්‍රී ලංකාවේ ප්‍රවාහන මාධ්‍යයක් ලෙස දෝලා භාවිතය පිළිබඳ විමර්ශනය කිරීම

එම්.ඩබ්.එන්.ටී.සුමනසේන

ඉතිහාසය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

nuwan.medawattha@gmail.com

මුඛ්‍ය පදඃ ශ්‍රී ලංකාව, දෝලාව, ප්‍රවාහනය, මූලාශ්‍රය,

## හැඳින්වීම

ප්‍රවාහනයේ ඇති වූ දියුණුවත් සමඟ නූතන ජනතාව රථවාහන උපයෝගී කර ගනිමින් එදිනෙදා කටයුතු සිදු කරගෙන තිබේ. වර්තමානයේ එසේ වුව ද අතීතයේ සිට මේ දක්වා කාලය තුළ ප්‍රවාහනයේ විවිධ සංධිස්ථාන පසු කරන්නට විය. ලංකාවේ පවතින භූ විෂමතාවන්ට ගැළපෙන ප්‍රවාහන මාධ්‍යයක් භාවිත කළ යුතු විය. ඒ අනුව සාමාන්‍ය ජනතාව පයින් ගමන් කළ අතර රජවරු හා ඇමතිවරු ඇතුළු ප්‍රභූ පිරිස් දෝලා හෙවත් පල්ලැක්කිවලින් ගමන් කරනු ලැබූහ. අනුරාධපුර යුගයේ සිට බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන යුගයේ මුල් වකවානුව තෙක්ම දෝලාවලින් ගමන් කිරීම ප්‍රකට ප්‍රවාහන මාධ්‍යයක් ලෙස පැවතුණි. පැරණි සාහිත්‍ය කෘතිවල දෝලාව හැඳින්වීම සඳහා **සිවිකා, හිදෝලි, හිදොලු, ඉදෝලි, ඉදෝලු, ඊදෝලි, රන්දෝලි, කුණම්, පැලැක්කි**, යන නාම භාවිත කර ඇත. දෝලාවේ ගමන් කළ පුද්ගලයාගේ තත්ත්වය අනුව දෝලාවේ ප්‍රමාණය, නිමාව සහ නිර්මාණ මාධ්‍යය ද තීරණය වූ බව ඒ සඳහා භාවිත කළ නම්වලින් පැහැදිලි වේ.

මහනුවර යුගය වනවිට දෝලාව විකාශනය වීමත් සමඟ ප්‍රභූ කොට්ඨාස අනුව පැලැක්කි වර්ග භාවිත වූ බව සැලකේ. **සිංහල විශ්වකෝෂයට** අනුව **කුණම** යනු රජතුමාගේ ගමන් බිමන් සඳහා වෙන් වූ වාහනය හෙවත් පල්ලැක්කියකි. කුණම රන්මුවා කොත්කැරලි පහකින් අලංකාර විය. වහලේ සිවු කොනේ කොත් කැරලි හතරක් ද මැද එක් කොත් කැරැල්ලක් ද වශයෙනි. අගබිසව සඳහා වෙන් වූයේ දෝලියයි. සෙසු බිසෝවරුන් සඳහා ඉදෝලිය ද භික්ෂූන් වහන්සේලාට පල්ලැක්කි ද රදළවරුන්ට දෝලාව ද දේවාභරණ වැඩමකිරීමට රන්දෝලිය ද ධාතු වැඩම කර වීමට රන් සිවිගේ ද භාවිත කර ඇත.

## ක්‍රමවේදය

අනුරාධපුර යුගයේ මුල් භාගයේ සිට මහනුවර යුගයේ අවසානය දක්වා ලාංකිකයන්ගේ දෝලා භාවිතය කිනම් ආකාරයෙන් සිදු කළේ ද යන්න සාහිත්‍යමය මූලාශ්‍රය මඟින් සනාථ කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මෙහිදී අධ්‍යයන ක්‍රමවේදය ලෙස ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතියික මූලාශ්‍රය අධ්‍යයනය

කරනු ලැබිණි. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වශයෙන් කුඹුරුලෙන බ්‍රාහ්මී ලෙන් ලිපිය, හඟුරන්කෙත විෂ්ණු දේවාලය , සබරගමු මහ සමන් දේවාලය හා විහාරස්ථාන වන පිලිකුත්තුව, තොටගමුව, සූරියගොඩ හා රිදී විහාරය ආශ්‍රිතව හා මහනුවර, කොළඹ, රත්නපුර යන කෞතුකාගාර ආශ්‍රිතව ඇති දෝලා අධ්‍යයනය කරනු ලැබිණි. ඒ අනුව සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන්හි සඳහන් දෝලා කිනම් ආකාරයට ලාංකිකයන් භාවිත කළේද එහි තොරතුරු සංසන්දනාත්මක විමර්ශනය කිරීම සිදුවිය.

**සාකච්ඡාව හා ප්‍රතිඵල**

ලාංකිකයන් අනුරාධපුර යුගයේ මුල් භාගයේ දෝලා භාවිත කළ බව මූලාශ්‍රයගත තොරතුරු තුළින් සනාථ වේ. පණ්ඩුකාභය රජු (ක්‍රි.පූ. පස්වැනි සියවසේ) විසින් අනුරාධපුර නගරයේ තැනින් තැන සිවිකාශාලා පිහිට වූ බව "**සිවිකා සොත්ථිසාලාං ච අකාරෙසි තහිං තහිං**" යනුවෙන් මහාවංසයේ දැක්වේ. මහාවංසටීකාව හෙවත් **වංසත්ථප්පකාසිනියේ** සිවිකාශාලා යන වචනය අරුත් දක්වා ඇත්තේ සිව ලිංග වන්දනාව සඳහා තිබූ ශාලාවක් හෝ සූතිකාගාරයක් වශයෙනි. **සිවිකාශාලා** යන්නේ අර්ථය දෝලාව බව පහත තොරතුරු අනුව පැහැදිලි වන්නකි.

පැරණි රජවරු දෝලාවෙන් ගමන්ගත් ආකාරය පිළිබඳ මහාවංසයේ දුටුගැමුණු කතා පුවතේ දැක්වේ. රජු මරණාසන්න අවස්ථාවේ මහාථූපය වැඳ පුදා ගැනීම සඳහා එතැනට ගෙන යන ලද්දේ සිවිකා නමින් හැඳින්වුණු දෝලාවකින් බව මහාවංසය දක්වයි.

"**සිවිකාය නිපජ්ජිත්වා ඉධාගන්ත්වා මහීපති - පදක්ඛිණං කරිත්වාන සිවිකායෙ ව චෙතියං**"

ඒ අනුව සිවිකා යනුවෙන් හඳුන්වන්නේ දෝලාව බව ද **හේම එල්ලාවල** මහතා ද පිළිගන්නා මතයකි.

ඉදෝලි, දෝලි හා කුණම් යන දෝලා වර්ග අනුරාධපුර යුගයේ සිටම ගමනාගමනය සඳහා යොදා ගත්හ. **දුටුගැමුණු රජු** ( ක්‍රි.පූ 161-137 ) එළාරගේ සොහොන ඉදි කර වූ ස්ථානයේ දාගැබක් කරවා " **මෑඇතුළු වූ එන දවස රජ දරුවන් ආදී වූ හැමදෙන ඇතුන්, අසුන්, ඉදෝලි, දෝලි, කුනම් නැඟී මෙතනින් නො ගිය මැනවැ යි** " යනුවෙන් ශිලා ලිපියක් කර වූ බව **සිංහල ථූපවංසයේ** දැක්වේ.

දඹදෙණි යුගයේ දී "කුණම්" ධනවතුන්ගේ ප්‍රවාහන මාධ්‍ය වූ බව පයින් ගමන් බැරි හෙයින් පොහොසතුන්ගේ දරුවන් ඉදෝලි, දෝලි, කුණම් හා රථ ආදී වූ යාන වාහනවලින් ගමන් කිරීමෙන් පැහැදිලි වේ. මහනුවර යුගයේ දී කුණම් රජතුමාට විශේෂ වූ දෝලා වර්ගයක් වුව ද පැරණි යුගයේ දී එය ප්‍රභූ පිරිස විසින් ද ගමනාගමනය සඳහා යොදාගන්නා ලද බව පෙනේ. ඒ බව සෙනරත් රජුගේ (ක්‍රි.ව.1604-1635) රාජ්‍ය සංචාරය පිළිබඳ සඳහන් **මන්දාරම්පුර පුවතේ** දැක්වේ. ඒ අනුව රජු ඇතෙකු පිට ගමන් කළ බව වේ.

**"සින්දු රාග කළගෙඩි නළු පිරිවරිනා**

**කුණම් නැඟුණු රජ පිරිසෙහි විය ගම නා**

**යළි නෙක නළු පිරිස් මැද නරනිඳු වඩි නා**

**සේසත් සෙවණ රන් සිවි ඇත්කුඹු පිටි නා**

**ධවලැත් කුඹු මත රන් සිවි නැඟු යෙහෙ න**

**සේසත් සෙවණ සෙනරත් නරනිඳු වඩින"**

මෙයින් පැහැදිලි වන්නේ කුණම් නමින් හැඳින්වූ දෝලා වර්ගය රජතුමාට පමණක් සීමා නොවූ බවත් රන් සිවි සහ කුණම් අතර වෙනසක් ද ඇති බව ය. රන් සිවි රත්රනින් සෑදූ බැවින් හෝ රත්රන් ආලේප කළ බැවින් හෝ එය කුණම්වලින් වෙනස් වූ බව ද කිව නොහැකි වන්නේ " **සුර හා යුරු රන් කුණම් දෝලා මහ සඟනට සලසා රුවිනි"** යනුවෙන් මන්දාරම්පුර පුවතේ දැක්වෙන බැවිනි. එයින් විද්‍යමාන වන්නේ රන් කුණම් ද තිබුණු බවයි. එසේ නම් රන් සිවි යනු ඇතෙකු පිට යෑමේ දී යොදා ගත් වාහනයක් ද යනු තවදුරටත් විමසිය යුතු වේ.

යුද්ධයෙන් මිය ගිය එළාර රජුගේ මෘත ශරීරය ද ගෙන යන ලද්දේ රන් සිවි ගෙයකිනි. තවද **ෆාහියන් හිමිගේ** වාර්තාවේ ද මෙවැනි සඳහනක් වෙයි. දහනව වැනි සියවසේ දී **ජෝන් ඩේවි** දුටු රන් සිවි ගෙය " **මනාව හැඩ ගසා සිත්කළු ලෙස සාදන ලද අඩි හතරක් පමණ උස් කණු මත පිහිටි කුඩා ස්වර්ණාලිප්ත ප්‍රසාද ශීර්ෂයක් විය ".**

දෝලාව හිදෝලු නමින් ද හැඳින්විණි. ගිලන් නොවූ අවස්ථාවල දී හිදෝලු හෙවත් දෝලාවෙන් ගමන් කිරීම භික්ෂූන්ට අකැප විය. ඒ බව "**නො ගිලන් වැ පිරිමිනින් උසුලන හිදොලු ඈ යානයෙහි හිඳීම දුකුළා වේ** " හා " **හිදොළු ගැලාදී යානයෙහි හුන්නාහට බණ කියා නම් දුකුළා වේ** " යන **සිඛවළද** පාඨයෙන් පැහැදිලි වේ. **දඹදෙණි කතිකාවතට** අනුව " **හුදලු වෑ පොරෝ ආදිය පුද්ගලික කොට පරිහරණය නොකොට යුතු දෝලා ආදී යානයක් පුද්ගලික කොට අනුභව නොකොට යුතු..."** භික්ෂූන් සම්බන්ධ විනය ශික්‍ෂා පනවා ඇත.

එසේම දෝලාවන් සඳහා විශේෂයෙන්ම උපයෝගී කරගන්නා ලද්දේ රිදී, පිත්තල හෝ යකඩ යන ලෝහ වර්ග ය. කළුවර ලියෙන් ද දෝලා තනන ලදී. මහනුවර සහ හඟුරන්කෙත විෂ්ණු දේවාලවල දෝලා යකඩින් නිර්මිත වූ ඒවා විය. ඇතැම් අවස්ථාවල දී දෝලාව තිර වියන් ආදියෙන් සරසා ඊට උඩින් නවයක් කොන් යොදන ලද පලස්මයක් උඩුවියනක් ද බඳින ලදී. දෝලාව ඔසවාගෙන යන අය එය පසෙකින් තබා විවේක ගන්නා අවස්ථාවල දී දෝලාවේ පොල්ල දරා සිටීම සඳහා කුරුපා පාවිච්චි කර ඇත. වාම් යකඩයකින් නිර්මාණය කරන ලද මේ කුරුපා **කොන්තේරු** නමින් ද හැඳින්විණ. දෝලාව ඔසවාගෙන යන්නට සවිකොට තිබූ දඬු කඳ ද රජතමය කැටයමින් අලංකාර කර තිබිණි.

මෙම දෝලා සම්බන්ධ තනතුරු ශ්‍රේණි සම්බන්ධ සංවිධානගතව පැවති බව මූලාශ්‍රය අධ්‍යයනයේ දී හඳුනාගනු ලැබූ අතර එහිදී "**සිවික අදක"** හෙවත් **සිවිකා අධ්‍යක්ෂක** නමින් හැඳින්වූ මොවුන් කුණම් දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂකවරුන් ලෙස

සේවය කළ බව **සෙනරත් පරණවිතාන** පවසයි. ආදී බ්‍රාහ්මී යුගයේ දී සිවිකා අධ්‍යක්ෂක යනුවෙන් තනතුරක් පැවති බව කුරුණෑගල දිස්ත්‍රික් **කුඹුරුලෙන** ප්‍රදේශයෙන් සොයා ගන්නා ලද ශිලා ලිපියෙන් පැහැදිලි වන්නකි.

**" මහරජශ ගමණි-අබයස ශිවික-අදක පරුමක-මඣිම(ශ) (ලෙ)නෙ ආගත-අනගත (චතු-දිශ-ශගස) "**

මින් කියවැන්නේ ගාමිණී අභය මහ රජු ගේ කුණම් දෙපාර්තමේන්තුවේ අධ්‍යයක්ෂක මජ්ඣිම විසින් පූජාකරන ලද ලෙනක් පිළිබඳවය.

පරාක්‍රමබාහු කුමාරයා වාහනයක නැගී රාජ වීදියක ගමන් කරන අවස්ථාවේ දී කඹය කඩාගත් බිහිසුණු මීමකු ඉදිරියට පැමිණීම නිසා උහු දක වාහනය ගෙන යන්නෝ ද එක්ව යන මිනිසුන් ද පළාගිය බව දක්වේ. එහි සඳහන්ව ඇත්තේ දෝලාවක් බව උපකල්පනය කළහැකිය. **බුවනෙකබාහු රජතුමා ද (ක්‍රි.ව.1272-1284)** දඹදෙණියෙන් නික්ම යාපහුව දුර්ගයට ගියේ දෝලාවකිනි. පෘතුගීසි පාලන සමයේ දී **සීතාවක හටනට** අනුව ප්‍රභුවරුන් ගමන් කළේ දෝලාවෙනි. **දෝන කතිරිනා, දෙවැනි රාජසිංහරජු ද (ක්‍රි.ව.1635-1687)විමලධර්මසූරියරජු** ද **(ක්‍රි.ව.1591-1604)** දෝලා භාවිත කළ බව මූලාශ්‍රය ඔස්සේ හෙළිවේ. **රොබට් නොක්ස්, ජෝන් ඩේවි, ජොන් ඩොයිලි** ආදී විදේශිකයන් දෝලා පිළිබඳ විවිධ තොරතුරු ගෙනහැර දක්වයි. රජ පවුලේ අය හැරුණු විට උසස් නිලධාරීන් ද ධනවත් අය ද ගමනාගමනය සඳහා දෝලාව යොදාගත් බවට සාහිත්‍ය මූලාශ්‍රයන්හි සඳහන් වේ.

**සමාලෝචනය**

ඉහත මූලාශ්‍රයන් අධ්‍යයනයේ දී ලංකිකයන් ප්‍රවාහන මාධ්‍යයක් ලෙස දෝලා භාවිත කිරීම සිදුකර ඇති බවත් එය ක්‍රමිකව විකාශනය වීමත් සමඟ විවිධ පුද්ගලයන්, විවිධ අරමුණු ඔස්සේ භාවිත කරන ලද බවත් පෙනේ. දෝලා වර්ග කිහිපයක් ඇති අතර පූර්ව බ්‍රාහ්මී යුගයන්හි සිට දෝලා සම්බන්ධ තොරතුරු සඳහන් වීම ද එයට අදාළ තනතුරු නාමවලියක් පමණක් නොව ගම්බිම් පවා ද වෙන් කර තිබූ බවහෙළිදරව් විණි. මේ අනුව සාහිත්‍යමය හාපුරාවිද්‍යාත්මක මූලාශ්‍රය සංසන්දනාත්මකව අධ්‍යයනයේ විවිධ මාදිලියේ දෝලා භාවිත කළ භාවිත කළ බවත් ප්‍රවාහන මාධ්‍යයක් ලෙස විවිධ සමාජ මට්ටම්වල පුද්ගලයන්ගේ වැඩි අවධානයක් දිනාගත් සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර තුළින් ඉහත පරිදි තහවුරු කරගත හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (සංස්). (1959)*මහාවංසය.* කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

ලංකානන්ද හිමි, ලබුගම. (සංස්). (1958)*මන්දාරම්පුර පුවත.* කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

විමලකිර්ති හිමි, මැද උයන්ගොඩ. (සංස්). (1955)*සිඛ වළඳ හා සිඛ වළඳ විනිස.* කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

පරණවිතාන, රෝහිනී. (සංස්). (1998)***සීතාවක හටන.*** කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.

කරුණාතිලක, ඩබ්.එස්. (සංස්). (1989)***සිංහල ථූපවංසය.*** කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.